# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1978/21 - 2016 අගෝස්තු මස 02 වැනි අඟහරුවාදා - 2016.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/2009

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30(3) වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 53 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2016 ක් වූ ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2016 අංක 03 දරන විදුලි (අයකුම සමාලෝචනය සහ ගැලපුම් කිරීමේ කාර්යපරිපාටි) රීති ලෙස හඳුන්වනු ලැබේ.

2.සෑම බලපත්‍රලාභියෙක් ම-

(අ) පනතේ 30(2)(අ) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති සහ කොමිෂන් සභාව අනුමත කළ අයකුම ක්‍රමවේදය; සහ

(ආ) අයකුම සමාලෝචන සහ ගැලපුම් කිරීමේ විස්තරාත්මක කාර්යපටිපාටිය,

අනුව, ඔවුන්ගේ ඉඩහල ආදායම් සහ අයකුම සමාලෝචනය සහ ගැලපුම් කිරීම ද අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අයකුම අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

3. සෑම බලපත්‍රලාභියෙක් ම කොමිෂන් සභාවට අයකුම අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේ දී අයකුම ක්‍රමවේදය අනුව කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තොරතුරු ගොනු කිරීමේ අවශ්‍යතාවයන් සහ ආකෘතීන් තුළ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් තොරතුරු සැපයිය යුතු ය.

4. පරිශිෂ්ටයේ දක්වා ඇති අයකුම සමාලෝචනය කිරීම සහ ගැලපුම්කිරීමේ කාර්යපටිපාටිය යටතේ, අයකුම සමාලෝචනය කිරීම සහ ගැලපුම්කිරීම -

(අ) ඔවුන්ගේ පාරිභෝගිකයන්ගෙන් එකතු කර ගැනීමට බලපත්‍රලාභියා හිමිකම් ලබන ඉඩහල ආදායම;සහ

(ආ) බලපත්‍රලාභියාට ඔවුන්ගේ ඉඩහල ආදායම එකතු කර ගැනීමට ඉඩ දෙන ලද එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා වන සහනාධාර සලකා බලමින් අදාල කර ගත යුතු අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා වන අයකුම උපලේඛනය,

සම්බන්ධව කොමිෂන් සභාවේ තීරණය සහ අනුමතය අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

5. පරිශිෂ්ටයේ දක්වා තිබෙන අයකුම ක්‍රමවේද අවශ්‍යතාවයන්ට අනුකූල නොවේ නම් කොමිෂන් සභාව විසින් අයකුම අයදුම්පත අනුමත නොකල යුතු ය.

6. බලපත්‍රලාභියකු විසින් ඉල්ලා සිටින ලද ඉඩහල ආදායම කොමිෂන් සභාව විසින් අනුමත නොකරයි නම්, කොමිෂන් සභාව විසින් ඒ සඳහා හේතු දක්වා බලපත්‍රලාභියාට අයකුම අයදුම්පත සංශෝධනය කිරීමට දැනුම් දිය යුතු ය.

7. බලපත්‍රලාභියා විසින් ඒ අනුකූලව අයකුම අයදුම්පත සංශෝධනය කළ යුතු ය. කොමිෂන් සභාව විසින් ඉඩහල ආදායම සඳහා අයකුම අයදුම්පත හෝ සංශෝධිත අයකුම අයදුම්පත අනුමත නොකරයි නම් කොමිෂන් සභාව ඉඩහල ආදායම අනුමත කරන තෙක් පවතින අයකුම එලෙසම බලපැවැත්විය යුතු ය.

8. ඉඩහල ආදායම සඳහා අයකුම අයදුම්පත අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉඩහල ආදායමට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් බලපත්‍රලාභියකු උපයා ඇත්නම්, කොමිෂන් සභාව විසින් ඉඩහල ආදායම සඳහා සංශෝධිත අයකුම අයදුම්පත අනුමත කිරීමත් සමඟ එකී අනුමත කරන ලද ඉඩහල ආදායමට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් බලපත්‍රලාභියා විසින් උපයන ලද ආදායමේ ප්‍රමාණය සහ එම ඉපයීම් සහ අනුමත ඉඩහල ආදායම ප්‍රතිසන්ධානය කරනු ලබන ආකාරය සහ පිළිබඳව බලපත්‍රලාභියාට දැන්විය යුතු ය.

9. කොමිෂන් සභාව විසින් අයකුම කාලසීමාව සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන්ගේ අයකුම උපලේඛනය අන්තර්ගත අයකුම සඳහා තීරණය ඉඩහල ආදායම සඳහා අනුමතය සමඟ අනුමත කළ යුතු යුතු ය.

10. බලපත්‍රලාභියා විසින් අවසාන පාරිභෝගිකයන් සඳහා අයකුම උපලේඛනය බලපැවැත්වීමට දින දහයකට පෙර, අනුමත අයකුම අඩුම වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් එක් ජාතික පුවත්පතක බැගින් පල කළ යුතු අතර ඒ සමඟම බලපත්‍රලාභියාගේ වෙබ් අඩවියේ ද පළ කළ යුතු ය.

11. කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාරය විමසා බැලීමෙන් පසුව:-

(අ) අයකුම සමාලෝචන සහ ගැලපුම් කිරීමේ විස්තරාත්මක කාර්යපරිපාටිය විසින් ස්ථාපිත කරන ලද කාලසීමාවන් සමඟ ගැළපෙන පරිදි පැවැත්වීමට නියමිත අයකුම සමාලෝචන සහ ගැලපුම් කිරීම් සඳහා නිශ්චිත දිනයන්; සහ

(ආ) (i) මහජන තොරතුරු විමසීම (මහජන ප්‍රශ්න විමසීම් ඇතුළුව, එවැන්නක් වේ නම්);

(ii) අයකුම ක්‍රමවේදය අනුව තොරතුරු මහජනතාවට බෙදා හැරීම; සහ

(iii) පළ කළ අයකුම සමාලෝචන සහ ගැලපුම් කිරීම් සඳහා සහභාගීවීමට පාරිභොගිකයන් සහ අනිකුත් කැමැත්තක් දක්වන පාර්ශවයන් විසින් භාවිතා කරන තොරතුරුකොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කිරීම,

සඳහා මහජනතාවට ඇහුම්කන්දීම සඳහා විශේෂිත දිනයන්, ජනවාරි මස අවසාන වැඩකරන දිනට පෙර ගැසට් පත්‍රයේ වාර්ෂිකව පළ කළ යුතු ය.

12. මෙම රීතිවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස:-

"පනත" යන්නෙන් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ;

"ගැලපුම" යන්නෙන් පිරිවැය ප්‍රත්‍යවේක්ෂක ගාස්තු ක්‍රමවේදයේ නිර්වචනය කර ඇති ගැලපුම් සූත්‍ර (ආදායම් පාලන සූත්‍ර) අනුව අයක්‍රම කාලසීමාව තුළ පිරිවැය ප්‍රත්‍යවේක්ෂක අයක්‍රම ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි අයක්‍රමවල සංඝටක ගැලපුම් කළ යුතු ක්‍රියාවලිය අදහස් කෙරේ. මෙම ගැලපුම් කිරීම සඳහා, පිරිවැය පරාවර්තික ගාස්තු ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි බලපත්‍රලාභියා විසින් තොරතුරු ඉදිරිපත් කිරීම හෝ ක්ෂුද්‍ර ආර්ථික දර්ශකයන් භාවිත කිරීම හෝ එම ක්‍රමයන් දෙකෙහි සංයෝජනයක් භාවිතා කිරීම අවශ්‍ය විය හැකි වේ.

"ඉඩහල ආදායම" යන්නෙන් පිරිවැය ප්‍රත්‍යවේක්ෂක අයක්‍රම ක්‍රමවේදය ප්‍රකාරව ගණනය කරන ලද උපරිම අනුමත ඉඩහල ආදායම අදහස් වේ.

"කොමිෂන් සභාව" යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව අදහස් වේ.

"දිනයන්" යන්නෙන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, අයක්‍රම කාලසීමාව ආරම්භවීමට පෙර වර්ෂයට අනුරූපි හෝ (යම් හෙයින් අයක්‍රම සංඝටක සමාලෝචනය කරන විට) හෝ ගැලපුම් කළ අයක්‍රම සංඝටක අදාල වීමට පෙර වර්ෂයකට අනුරූපි වූ සියලු දිනයන් (යම් හෙයකින් අයක්‍රම සංඝටක වාර්ෂිකව ගැලපුම් කරන විට) හෝ ගැලපුම් කළ අයක්‍රම උපාංගය අදාල කර ගැනීමට පෙර මාස හයක කාලසීමාවට අනුරූපි වූ සියලු දිනයන් (වර්ෂයකට දෙවරක් අයක්‍රම සංරචක ගැලපීම් කරන විට) අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි සමාලෝචනයට යටත්ව සහ එම අයක්‍රමයන් සමාලෝචනය කිරීම සඳහා කාර්යපටිපාටියක් පිළිබඳව නිශ්චිතව විධිවිධාන ඇතුළත් නොවන සම්ප්‍රේෂණය සහ තොග විකිණුම් අයක්‍රම හෝ බෙදාහැරීම සහ සැපයුම් අයක්‍රම සඳහා විධිවිධාන ඇතුළත් වන බලපත්‍රයක් හිමි අවස්ථාවෝචිත පරිදි සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු හෝ බෙදාහැරීම් බලපත්‍රලාභියකු අදහස් කෙරේ.

"දැනුම්දීම" යන්නෙන් මෙම පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත සහ අයක්‍රම ක්‍රමවේදය යටතේ දෙන ලද බලය අනුව ගන්නා ලද ඕනෑම තීරණයක් බලපත්‍රලාභීන්ට කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලබන ලිඛිත සන්නිවේදන ක්‍රමයක් අදහස් වේ. මුල් ලිපි හෝ සංඛ්‍යාංකිත අයුරින් අත්සන් යොදන ලද (ඩිජිටල් ලෙස) විද්‍යුත් තැපැල මෙම කාර්යය සඳහා වලංගු ලිඛිත සන්නිවේදන ක්‍රම ලෙස සැලකේ.

"ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනත" යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනත අදහස් වේ.

"අයක්‍රම ක්‍රමවේදය" යන්නෙන් කොමිෂන් සභාව විසින් අනුමත කළ බහුවර්ෂ පිරිවැය ප්‍රත්‍යවේක්ෂක ක්‍රමවේදය අදහස් වේ.

"අයක්‍රම කාලසීමාව" යන්නෙන් අයක්‍රම සමාලෝචනය කිරීමට පිරිවැය ප්‍රත්‍යවේක්ෂක අයක්‍රම ක්‍රමවේදයේ ස්ථාපිත කර ඇති සෑම අවුරුදු පහක කාලසීමාවක් ම අදහස් වේ. පළමුවන අයක්‍රම කාලසීමාව 2011 ජනවාරි මස 1 වන දින ආරම්භ වී ඇත. පසු අයක්‍රම කාලසීමාවන් 2016 ජනවාරි 1 වන දින, 2021 ජනවාරි 1 වන දින ආදි ලෙස ආරම්භ විය යුතු ය.

"සමාලෝචනය" යන්නෙන් අයක්‍රමවල සංඝටක අයක්‍රම ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි පළමුවරට ස්ථාපිත කිරීම හෝ සෑම අයක්‍රම කාලසීමාවක් අවසානයේ නැවත සැකසීම කරන ක්‍රියාවලිය අදහස් වේ. මෙම කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින්, අවශ්‍ය කරනු ලබන තොරතුරු එහි ස්ථාපිත කර ඇති යාන්ත්‍රණය අනුව ඉදිරිපත් කළ යුතු බව පිරිවැය ප්‍රත්‍යවේක්ෂක අයක්‍රම ක්‍රමවේදය මගින් ස්ථාපිත කරයි. සමාලෝචනය සඳහා අනුමතය කොමිෂන් සභාව විසින් ලබා දිය යුතු ය.

"ලිඛිත ඉල්ලීම" යන්නෙන් මෙම පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත සහ පිරිවැය ප්‍රත්‍යවේක්ෂක අයක්‍රම ක්‍රමවේදය යටතේ ලබා දී ඇති බලතල අනුව කොමිෂන් සභාව විසින් විශේෂිත අවශ්‍යතාවයක් සඳහා ප්‍රතිචාර දැක්වීමට බලපත්‍රලාභියාගෙන් ඉල්ලීමක් කරනු ලබන ලිඛිත සන්නිවේදන ක්‍රමයක් අදහස් වේ. ලිපිවල මුල් පිටපත් (අත්සන් කරන ලද) හෝ සංඛ්‍යාංකික අයුරින් අත්සන් යොදන ලද (ඩිජිටල් ලෙස) විද්‍යුත් තැපැල මෙම කාර්යය සඳහා වලංගු ලිඛිත සන්නිවේදනයක් ලෙස සැලකේ.

"ලිඛිත ප්‍රතිචාරය" යන්නෙන් ලිඛිත ඉල්ලීමකට ප්‍රතිචාරයක් ලෙස කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් අදහස් වේ. ලිපිවල මුල් පිටපත් සහ සංඛ්‍යාකික අයුරින් අත්සන් යොදන ලද (ඩිජිටල් ලෙස) විද්‍යුත් තැපැල ලිපි මෙම කාර්යය සඳහා වලංගු ලිඛිත සන්නිවේදන ලෙස සැලකේ.

**පරිශිෂ්ටය**

**I වන කොටස**

**අයක්‍රම සමාලෝචන සහ ගැලපුම් විස්තරාත්මක කාර්යපටිපාටින්**

**අයක්‍රම සමාලෝචන සහ අයක්‍රම ගැලපුම් උපලේඛනය**

1. අයක්‍රම ක්‍රමවේදය අනුව විය යුතු විදුලි අයක්‍රම සංඝටක සහ උපසංඝටක පහත පරිදි සමාලෝචනය සහ ගැලපුම් කළ යුතු ය.

**අ. සමාලෝචනයන්.**

2. කොමිෂන් සභාව විසින් අදාල අයක්‍රම කාලසීමාව සඳහා පහත ගාස්තු සංඝටක සෑම ගාස්තු කාලසීමාවකට එක් වරක් සමාලෝචනය සහ අනුමත කිරීම කළ යුතු ය:-

(අ) සම්ප්‍රේෂණ ඉඩහල ආදායම;

(ආ) තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර අනුමත ආදායම්;

(ඇ) තොග සැපයුම් අයක්‍රම පුරෝකථන;

(ඈ) බෙදාහැරීම් ඉඩහල ආදායම; සහ

(ඉ) අලාභ සාධක ගැලපුම් ඇතුළත්ව සිල්ලර සේවා අයක්‍රම.

**ආ. ගැලපුම්.**

3. කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන අයක්‍රම උපාංග අයක්‍රම ක්‍රමවේදයේ ඇතුළත් ආදායම් පාලන සූත්‍ර අනුව අයක්‍රම කාලසීමාව තුළ ගැලපුම් කර අනුමත කළ යුතු ය:-

(අ) සම්ප්‍රේෂණ ඉඩහල ආදායම් වාර්ෂික ගැලපුම;

(ආ) තොග සැපයුම සඳහා අනුමත ආදායම් සහ මෙහෙයුම් ව්‍යාපාර වාර්ෂික ගැලපුම;

(ඇ) තොග සැපයුම් අයක්‍රම පුරෝකථන ගැලපුම් අර්ධ වාර්ෂික ගැලපුම;

(ඈ) බෙදාහැරීම් ඉඩහල ආදායම් වාර්ෂික ගැලපුම; සහ

(ඉ) අලාභ සාධක ගැලපුම ඇතුළත් සිල්ලර සේවා අයක්‍රම වාර්ෂික ගැලපුම.

**ඇ. අති විශේෂ සමාලෝචනය**

4. (අ) යම් වර්ෂයක් තුළ සුචීකරණ සූත්‍රයේ සම්මුච්චිත වෙනස 15% ඉක්මවන විට;හෝ

(ආ) අනපේක්ෂිත සහසැලකිය යුතු තොග සැපයුම් අයක්‍රම පුරෝකථන විචලනයක් වන විට; හෝ

(ඇ) යම් වර්ෂයක් තුළ අනපේක්ෂිත සැලකිය යුතු සිද්ධියක් හේතුවෙන් උපචිත වූ පිරිවැය, වර්ෂයේ ඉඩහල ආදායමෙන් 25% ක් ඉක්මවන විට,

සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාහට අතිවිශේෂ ඉඩහල ආදායම් සමාලෝචන, අනුමතය සඳහා කොමිෂන් සභාව වෙත භාර දිය හැකි ය.

5. (අ) යම් වර්ෂයක් තුළ සුචීකරණ සූත්‍රයේ සම්මුච්චිත වෙනස15% ඉක්මවන විට; හෝ

(ආ) යම් වර්ෂයක් තුළ අනපේක්ෂිත සැලකිය යුතු සිද්ධියක් හේතුවෙන් උපචිත වූ පිරිවැය, එම වර්ෂයේ අනුමත ආදාමෙන් 25% ක් ඉක්මවන විට,

බෙදාහැරීම් බලපත්‍රලාභියාහට අතිවිශේෂ ඉඩහල ආදායම් සමාලෝචන, අනුමතය සඳහා කොමිෂන් සභාව වෙත භාර දිය හැකි ය.

**II** වන කොටස

සහනාධාර

ඈ. තෝරාගත් පාරිභෝගික කාණ්ඩ සඳහා බාහිර සහනාධාර.

6. කොමිෂන් සභාව විසින් යම් අයකුම කාලසීමාවක් ආරම්භවීමට පෙර සියලුම කොටස්වලට පහසුකම් සපයමින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන අයකුම කාලසීමාවන් සඳහා ඇස්තමේන්තුගත සහනාධාර ප්‍රමාණයන් ඇතුළත් කරමින් සහනාධාර ප්‍රමාණ පිළිබඳ ප්‍රක්ෂිප්ත වාර්තාවක් භාණ්ඩාගාරය වෙත අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. මෙම අධ්‍යයනය මගින් අයකුම කාලසීමාවේ පළමු අවුරුද්ද සඳහා වූ අවශ්‍යතාවයන් සහ පළමු අයකුම කාලසීමාවේ පසු අවුරුදු සඳහා වූ ප්‍රක්ෂේපණ අවශ්‍යතාවයන්ගේ ද ආවරණය කළ යුතු ය. අයකුම කාලසීමාවේ පවත්නා වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් ඊළඟ වර්ෂය සඳහා අවශ්‍ය වන සහනාධාර ප්‍රමාණයන් යාවත්කාලීන කළ යුතු වන අතර ඊළඟ වර්ෂය සඳහා අවශ්‍ය වන සහනාධාර ප්‍රමාණයන් සඳහා භාණ්ඩාගාර අනුමතය ලබා ගත යුතු ය.

7. (අ) අප්‍රේල් මාසයේ අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර බලපත්‍රලාභියා විසින් පහත සඳහන් ලියවිලි (කොමිෂන් සභාව විසින් අනුමත කළ ආකෘතීන් භාවිත කරමින්) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය:-

(අ) තොග සැපයුම් ගණුදෙනු ගිණුම් ප්‍රකාශය (BSTA);

(ආ) බෙදාහැරීම් බලපත්‍රලාභියා - විකුණුම් සහ ඉල්ලීම් පුරෝකථන;

(ඇ) බෙදාහැරීම් බලපත්‍රලාභියා - බෙදාහැරීම් සැලසුම් සහ ප්‍රාග්ධන වියදම් (CAPEX) වැඩසටහන්;

(ඈ) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා - සම්ප්‍රේෂණ සැලැස්ම සහ ප්‍රාග්ධන වියදම් (CAPEX) සැලැස්ම;

(ඉ) උත්පාදන බලපත්‍රලාභියා - උත්පාදන නැවත බලගැන්වීමේ සැලැස්ම;

(ඊ) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා - එළඹෙන මාස හයේ කාලසීමා තුනක් සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන (අයකුම කාලසීමාවේ පළමු වර්ෂය අවසාන වන තුරු)සහ අයකුම කාලසීමාව අවසන් වන තුරු ඉතිරි මාස හයේ කාලසීමා සඳහා තොග සැපයුම් අයකුම ප්‍රක්ෂේපණ;

(උ) සියළු බලපත්‍රලාභීන් පෙර වර්ෂය සඳහා විගණනය කළ ගිණුම්, බලපත්‍රලාභියා සතුව විගණනය කරන ලද ගිණුම් නොමැති අවස්ථාවක අවම වශයෙන් විගණනය නොකළ ගිණුම්.

(ආ) කොමිෂන් සභාව විසින් ඉහත එක් එක් ලියවිලි සකස් කිරීම පිළිබඳව විස්තරාත්මක උපලේඛනයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

8. සෑම වර්ෂයකම මැයි මස අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර කොමිෂන් සභාව අයකුම ක්‍රමවේදය භාවිත කර දළ අයකුම ඇස්තමේන්තුවක් සැකසිය යුතු අතර එය එහි වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

9. සෑම වර්ෂයකම ජූනි 15 වන දින හෝ ඊට පෙර කොමිෂන් සභාව ඊළඟ වර්ෂය සඳහා සහනාධාර ප්‍රමාණ ප්‍රක්ෂේපණ වාර්තාව භාණ්ඩාගාරය වෙත භාර දිය යුතු ය.

10. භාණ්ඩාගාරය වෙත සහනාධාර ප්‍රමාණ ප්‍රක්ෂේපණ වාර්තාව භාර දුන් විගස භාණ්ඩාගාරයේ අනුමතය ලබා ගැනීමට සහ එය ජාතික අයවැය සැකසීමේ දී එහි ඇතුළත් කිරීම සඳහා අනුමතය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයට ඉල්ලීමක් කළ යුතු ය.

11. සෑම වර්ෂයකම ජූලි මාසයේ අවසාන වැඩකරන දිනට හෝ ඊට පෙර, එම සහනාධාර ප්‍රමාණයන් සඳහා ජාතික අය වැයේ ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා අනුමතය ලබා ගැනීම පිණිස භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින ලද යම් අතිරේක තොරතුරු සහ පැහැදිලි කිරීම් කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාරය වෙත සැපයිය යුතු ය.

## III වන කොටස

### අයක්‍රම කාලසීමාව සඳහා අයක්‍රම සමාලෝචන ක්‍රියාවලිය

**ඉ. අරමුණ සහිත සාමාන්‍ය පැතිකඩ**

12. සෑම අයක්‍රම කාලසීමාවකම අවසාන වර්ෂයේ ජනවාරි මාසයේ අවසාන වැඩකරන දිනට හෝ ඊට පෙර, ජනවාරි 1 වන දිනෙන් පටන් ගන්නා අයක්‍රම කාලසීමාවට අදාළ වන සමාලෝචනයන් සහ ගැලපුම් දින දර්ශනය කොමිෂන් සභාව සියලු බලපත්‍රලාභීන්ට දැනුම් දී දන්වා සිටිය යුතු ය. එම දින දර්ශනය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කළ යුතු ය.

13. කොමිෂන් සභාව විසින් දින දර්ශනය සමඟ, පහත සඳහන් කරුණු බලපත්‍රලාභියාට දැනුම් දිය යුතු ය:-

(අ) අයක්‍රම ක්‍රමවේදයේ ස්ථාපිත කර තිබෙන සහ අයක්‍රම කාලසීමාව ආරම්භ වීමට පෙර කොමිෂන් සභාව විසින් නිර්වචන කිරීමට අවශ්‍ය කරන නොයෙකුත් පරාමිතීන්;

(ආ) තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු ගත කිරීම ආදිය සඳහා භාවිත කිරීම පිණිස කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අකෘතීන් හි යාවත්කාලීන කිරීම් තිබේ නම් ඒවා;

(ඇ) එක් එක් බලපත්‍රලාභියා විසින් භාරදීමට නියමිත නමුත් මෙතෙක් භාරදී නොමැති යම් තොරතුරු.

14. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතීන් භාවිතකොට අවශ්‍යවන තොරතුරු සෑම බලපත්‍රලාභියකු විසින් ම භාර දිය යුතු ය. කොමිෂන් සභාව යෝග්‍යයැයි තීරණය කරන පරිදි බලපත්‍රලාභීන්ගේ තොරතුරු යොමු කිරීමේ පද්ධතිය හෝ කොමිෂන් සභාව විසින් එම කාර්යය සඳහා සකසා ඇති වෙනත් යම් තොරතුරු තාක්ෂණික ක්‍රියාවලියක් භාවිතා කර එම ආකෘතීන් විද්‍යුත් මාධ්‍යයෙන් භාර දිය යුතු ය.

15. කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභියාට මෙම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය පුහුණුව සහ සහාය සැපයිය යුතු ය.

16. අයක්‍රම ක්‍රමවේදයේ අවශ්‍යතාවයන් හෝ කොමිෂන් සභාව විසින් ඉල්ලන ලද වෙනත් යම් තොරතුරක් සැපයීමට බලපත්‍රලාභියෙක් අපොහොසත් වන විට, කොමිෂන් සභාව විසින් -

(අ) යම් දීර්ඝ කිරීමක් ප්‍රායෝගික නම්, එම දීර්ඝ කිරීම කරන ලද කාලසීමාව තුළ තොරතුරු භාරදීමට ඉල්ලා සිටිය යුතු ය;

(ආ) ලබා දුන් කාලසීමාව ඉක්මවා ඇතිවිට සහ බලපත්‍රලාභියා කොමිෂන් සභාවේ ඉල්ලීමට නිසි ලෙස ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් බලපත්‍රලාභියා භාර නොදුන් තොරතුරු ලබා ගැනීමට තම විමර්ශනයක් පැවැත්විය යුතු ය;

(ඇ) බලපත්‍රලාභියාට එරෙහිව මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ නීතිමය ක්‍රියාමාර්ගය ගත හැකි ය; සහ

(ඈ) බලපත්‍රලාභියා විසින් භාර නොදුන් තොරතුරු ලබාගැනීමට කරන ලද විමර්ශනය සම්බන්ධ දරන ලද පිරිවැය අයකර ගැනීම කළ හැකි ය.

**ඊ. සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම සහ මෙහෙයුම් අනුමත ආදායම් සමාලෝචන**

17. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අයක්‍රම සමාලෝචන සහ ගැලපුම් විස්තරාත්මක කාර්යපරිපාටින් අනුව අදාල ආදායම් සමාලෝචන කාර්යපරිපාටිය අනුව එළඹෙන අයක්‍රම කාලසීමාව සඳහා සම්ප්‍රේෂණ ඉඩහල සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර ඉඩහල ආදායම කොමිෂන් සභාවේ අනුමතය සඳහා අගෝස්තු මස පළමු වැඩකරන දින හෝ ඊට පෙර කොමිෂන් සභාවට භාර දිය යුතු ය.

18. (1) කොමිෂන් සභාව විසින්, භාර දුන් දිනය සහ ඔක්තෝම්බර් මස පළමු වැඩකරන දින අතර -

(අ) එය අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ආ) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු අතර, එය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

(2) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් එම ඉල්ලීම ලැබී වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු සැපයිය යුතු ය.

19. කොමිෂන් සභාව විසින් ඔක්තෝම්බර් මස පළමු වැඩකරන දිනට පෙර සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර ඉඩහල ආදායම සම්බන්ධ අදාළ තීරණය අනුමත කළ යුතු අතර එම අනුමතයෙන් පැය 24 ක් ඇතුළත -

(අ) එම අදාළ තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කළ යුතු ය; සහ

(ආ) වැඩකරන දින 20 ක කාලයක් තුළ අදාළ තීරණය සම්බන්ධ අදහස්, නිරීක්ෂණයන් ආදිය කොමිෂන් සභාව භාර ගන්නා බව සියලු බලපත්‍රලාභීන් සහ මහජනතාව වෙත දැනුම් දිය යුතු ය.

20. කොමිෂන් සභාව විසින් නොවැම්බර් මස 15 වන දිනට පෙර සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම් සහමෙහෙයුම් ව්‍යාපාර අනුමත ආදායම් සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර අනුමතයෙන් පසු වැඩකරන දින 5 ක් ඇතුළත -

(අ) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට දැනුම් දීම කළ යුතු ය; සහ

(ආ) තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

### ඇ. අයකුම කාලසීමාව සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන

21. අයකුම සමාලෝචන සහ ගැලපුම් විස්තරාත්මක කාර්යපරිපාටිය අනුව, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා නොවැම්බර් මස පළමු වැඩ කරන දිනට පෙර අයකුම කාලසීමාවක් සඳහා අප්‍රේල් මස පළමු දිනයෙන් සහ ඔක්තෝම්බර් මස පළමු දිනයෙන් ආරම්භ වන සෑම හය මසක කාල සීමා සඳහාම තොග සැපයුම් අයකුම පුරෝකථනයන් අනුමතය සඳහා කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය.

22. අයකුම කාලසීමාවේ පළමු මාස හයක කාලය සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන විස්තර සහිතව භාර දිය යුතු අතර අයකුම කාලසීමාව තුළ ඉතිරි මාස හයක කාලසීමාවන් සඳහා ප්‍රක්ෂිප්ත පුරෝකථන ලෙස භාර දිය යුතු ය.

23. අයකුම කුමවේදයේ නියමයන් අනුව පළමු මාස හය තුළ අදාල කර ගන්නා ලද තොග සැපයුම් ගණුදෙනු ගිණුමේ පෙන්වන පරිදි පුරෝකථනය සහ සත්‍ය තොග සැපයුම් අයකුම අතර වෙනස සඳහා වන්දිය ද මෙම ඉදිරිපත් කිරීම්වල අන්තර්ගත විය යුතු ය.

24. (1) භාර දෙන ලද දිනය සහ ජනවාරි මස පළමු වැඩකරන දිනය අතර කොමිෂන් සභාව විසින් -

(අ) තොග සැපයුම් අයකුම පුරෝකථන අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ආ) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදාළ බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු වන අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

(2) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ඉල්ලීම ලැබී වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු සැපයිය යුතු ය.

25. කොමිෂන් සභාව විසින් එම වර්ෂයේම ජනවාරි මස පළමු වැඩකරන දිනයට පෙර අයකුම කාලසීමාවේ පළමු මාස හය සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන සම්බන්ධ කෙටුම්පත් තීරණයක් සැකසිය යුතු අතර අනුමතයෙන් පැය 24 ක් ඇතුළත -

(අ) අදාල තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කළ යුතු ය; සහ

(ආ) එම අදාල තීරණය පිළිබඳ වැඩකරන දින 10 ක් ඇතුළත අදහස්, නිරීක්ෂණ ආදිය කොමිෂන් සභාව විසින් භාර ගන්නා බව සියලු බලපත්‍රලාභීන්ට සහ මහජනතාව වෙත දැනුම් දීම කළ යුතු ය.

26. කොමිෂන් සභාව විසින් අදාළ කාලසීමාවේ නොවැම්බර් මස 15 වන දිනට පෙර අයකුම කාලසීමාවේ පළමු හය මස සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන සම්බන්ධ තීරණය, අනුමත කළ යුතු අතර -

(අ) අයකුම කාලසීමාවේ පළමු හය මස සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන සඳහා අනුමතය සහ අයකුම කාලසීමාවේ පළමු හය මස සඳහා තොග සැපයුම ගණුදෙනු ගිණුමේ සමුච්චිත අපගමනයන් සඳහා වන්දිය සියලු බලපත්‍රලාභීන්ට දැනුම් දිය යුතු ය; සහ

(ආ) අයකුම කාලසීමාවේ පළමු හය මස සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන සම්බන්ධ අනුමත තීරණය සහ අයකුම කාලසීමාවේ පළමු හය මස සඳහා තොග සැපයුම ගණුදෙනු ගිණුමේ සමුච්චිත අපගමනයන් සඳහා වන්දිය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකළ යුතු ය.

**ඖ. ගැලපුම්කරන ලද සහ පුරෝකථන කළ තොග සැපයුම් අයකුම (ABST)**

27. ගැලපුම්කරන ලද සහ පුරෝකථනය කළ තොග සැපයුම අයකුම (ABST) ක්‍රමවේදය ඒකීය ජාතික අයකුමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ.

28. (අ) මාර්තු මස 15 වන දිනට පෙර එළඹෙන අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී මාස හයක කාලයක් සඳහා තොග සැපයුම්කරු විසින් බෙදාහැරීම් බලපත්‍රලාභීන් ඉන්වොයිස් කිරීමට යොදා ගන්නා ගැලපුම්කරන ලද සහ පුරෝකථනය කළ තොග සැපයුම් අයකුම සම්බන්ධ තීරණය සෑම බලපත්‍රලාභියෙක් සඳහා ම කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින් -

(i) අනුමත කිරීමෙන් වැඩකරන දින 5 ක් ඇතුළත අනුමතය සම්බන්ධව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ බෙදාහැරීම බලපත්‍රලාභියාට දැනුම් දීම; සහ
(ii) අනුමත තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම,

කළ යුතු ය.

**එ. බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම සමාලෝචනය**

29. සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියකු විසින් ම අයකුම සමාලෝචනය සහ ගැලපුම් විස්තරාත්මක කාර්යපරිපාටිය අනුව, අයකුම කාලසීමාව ආරම්භවීමට පෙර වර්ෂයේ අගෝස්තු මස පළමු වැඩ කරන දිනට පෙර, බෙදා හැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම සමාලෝචන කොමිෂන් සභාවේ අනුමතය සඳහා භාර දිය යුතු ය.

30. (1) භාර දෙන ලද දිනය සහ ඔක්තෝම්බර් මස පළමු වැඩකරන දිනය අතර කොමිෂන් සභාව විසින් -

(අ) ඒ අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ
(ආ) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු අතර, එය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් ඉල්ලීම ලැබී වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු ලබා දිය යුතු ය.

31. කොමිෂන් සභාව විසින් ඔක්තෝම්බර් මස පළමු වැඩකරන දිනට පෙර, සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියකුගේම බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම සම්බන්ධ කෙටුම්පත් තීරණය අනුමත කළ යුතු අතර එම අනුමතයෙන් පැය 24 ක් ඇතුළත -

(අ) එක් එක් බෙදාහැරීම් බලපත්‍රහිමියාගේ කෙටුම්පත් තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ආ) එක් එක් බෙදාහැරීම් බලපත්‍රහිමියාගේ කෙටුම්පත්තීරණය පිළිබඳ අදහස් නිරීක්ෂණ ආදිය වැඩකරන දින 20 ක් ඇතුළත කොමිෂන් සභාව භාර ගන්නා බව සියලු බලපත්‍රලාභීන්ට සහ මහජනතාවට දැනුම් දිය යුතු ය.

32. කොමිෂන් සභාව විසින් නොවැම්බර් මස 15 වන දිනට පෙර එක් එක් බෙදාහැරීම් බලපත්‍රලාභියකුගේම බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර එම අනුමතයෙන් වැඩකරන දින 5 ක් ඇතුළත -

(අ) බෙදාහැරීම් බලපත්‍රලාභියාට දැනුම් දීම කළ යුතු ය; සහ

(ආ) තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

**ඒ. අයකුම කාලය සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා වන අයකුම උපලේඛනය**

33. අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා වන අයකුම උපලේඛනය සැකසීම-

(අ) අදාල බලපත්‍රලාභියා විසින් පිළියෙල කර නොවැම්බර් මස පළමු වැඩකරන දිනට පෙර කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් ජනවාරි මස පළමු වැඩකරන දිනට පෙර කළ යුතු ය.

34. කොමිෂන් සභාව විසින් ජනවාරි මස පළමු වැඩකරන දිනට හෝ ඊට පෙර, අයකුම ක්‍රමවේදය විසින් විස්තර කරන ලද ගැලපුම්වලට යටත්ව, එළඹෙන අප්‍රේල් මස 1 දින සිට ආරම්භ වන අයකුම කාලසීමාව සඳහා අදාල කර ගත යුතු අවසාන විදුලි පාරිභෝගිකයන්ගේ අයකුම උපලේඛනය සම්බන්ධ සාකච්ඡා පත්‍රිකාව ප්‍රසිද්ධ කළ යුතු ය.

35. කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ලද අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා වන බෙදා හැරීම් සහ සැපයුම් අයකුම සම්බන්ධ සාකච්ඡා පත්‍රය සමග -

(අ) එළඹෙන අයකුම කාලසීමාව සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා වන සැපයුම් අයකුම සහ මහජන සාකච්ඡාව සඳහා වන දිනය ප්‍රකාශ කිරීම;

(ආ) අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා බෙදාහැරීම් සහ සැපයුම් අයකුම සම්බන්ධ සාකච්ඡා පත්‍රය නිකුත් කිරීම සහ මහජන සාකච්ඡාව පිළිබඳ දැන්වීම පිළිබඳ සියලු බලපත්‍රලාභීන්ට දැනුම්දීම;

(ඇ) අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා බෙදාහැරීම් සහ සැපයුම් අයකුම සම්බන්ධ සාකච්ඡා පත්‍රය එහි වෙබ් අඩවියේ ඇතුළත් කිරීම; සහ

(ඈ) අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා බෙදාහැරීම් සහ සැපයුම් අයකුම සම්බන්ධ සාකච්ඡා පත්‍රය, මහජන සාකච්ඡා කාර්යපරිපාටින් සහ මහජන සාකච්ඡා දැනුම්දීම සම්බන්ධව මහජනතාවට දැනුම්දීම,

සිදු කළ යුතු ය.

**ඔ. අවසාන විදුලි පාරිභෝගිකයන්ගේ අයකුම සමාලෝචනය සඳහා මහජන සාකච්ඡාව**

36. කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද කාර්යපරිපාටිය අනුව මහජන සාකච්ඡාව පැවැත්විය යුතු ය.

37. මහජන සාකච්ඡාව ජනවාරි මස 20 වන දිනට පෙර පැවැත්විය යුතු ය.

**ඕ. අයකුම කාලය සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන්ගේ අයකුම**

38. කොමිෂන් සභාව විසින් මාර්තු මස 15 දිනට පෙර, එළඹෙන අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන වසර පහක කාලය සඳහා අයකුම සම්බන්ධ තීරණය අනුමත කළ යුතු ය.

39. අයකුම සම්බන්ධ තීරණයයෙන් පසු වැඩකරන දින 5ක් ඇතුළත, කොමිෂන් සභාව විසින්-

(i) අයකුම සම්බන්ධ තීරණය සියලු බලපත්‍රලාභීන්ට දැනුම් දීම;
(ii) තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම; සහ
(iii) අයකුම සම්බන්ධ තීරණය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම,

කළ යුතු ය.

## IV වන කොටස

### අයකුම කාලසීමාවේ අයකුම ගැලපීම

40. පහත අයකුම සංඝටක අදාළ වන වර්ෂය තුළ නියමිත ගැලපුම් කිරීම් පදනම් කරගෙන අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන මාස හයක කාලසීමාව සහ ඔක්තෝම්බර් 1 වන දින සිට ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා වශයෙන් අයකුම කාලසීමාවේ සෑම වර්ෂයක් තුළ අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා අයකුම උපලේඛනය දෙවතාවක් ගැලපුම් කළ යුතු ය:-

(අ) ජනවාරි 1 වන දින සිට ආරම්භ වන අවුරුදු 1 ක කාලසීමාව -

(i) සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම් සහ මෙහෙයුම ව්‍යාපාර ඉඩහල ආදායම ගැලපුම;
(ii) බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම ගැලපුම්;

(ආ) අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන මාස හයක කාලසීමාව -

(i) තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම;
(ii) ABST පුරෝකථනය;

(ඇ) ඔක්තෝම්බර් 1 වන දින සිට ආරම්භ වන මාස හයක කාලසීමාව -

(i) සහනාධාර ගැලපීම්;
(ii) තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපුම්; සහ
(iii) ABST පුරෝකථනය.

41. ඒකීය ජාතික අයකුමයක් ක්‍රියාත්මක කරන කාලසීමාවේ සෑම මාස තුනක කාලයක් සඳහා අයකුම ක්‍රමවේදය අනුව පශ්චාත් සිදුවීම් වන්දිය ගණනය කළ යුතු අතර එය බෙදාහැරීම් සහ සැපයුම් බලපත්‍රලාභීන්ට ගෙවිය යුතු ය.

42. අයකුම කාලසීමාවේ සෑම වර්ෂයකම ජනවාරි මස අවසාන වැඩකරන දිනට පෙර කොමිෂන් සභාව විසින් වර්ෂයට අදාල වන සියලු සමාලෝචනයන් සහ ගැලපුම් සඳහා දින දර්ශනය සියලු බලපත්‍රලාභීන්ට නිවේදනය කර දන්වා සිටිය යුතු අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ද ඇතුළත් කළ යුතු ය.

**අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන මාස හයක කාලසීමාව තුළ දී කෙරෙන අයකුම ගැළපුම්**

**ක. තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපීම්**

43. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අයකුම සමාලෝචන විස්තරාත්මක කාර්යපරිපාටිය අනුව, තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් කොමිෂන් සභාව වෙත අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

44. අයකුම කාලසීමාවේ සෑම වර්ෂයක ඔක්තොම්බර් 1 වන දින සිට ආරම්භ වන හය මසක කාලය සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් අයකුම කාලසීමාවේ අදාල වර්ෂයේ මැයි මස පළමුවන වැඩකරන දිනට පෙර භාර දිය යුතු ය.

45. (අ) අයකුම කාලසීමාවේ එළඹෙන මාස හය කාලසීමාවන් දෙක සඳහා උත්පාදන පිරිවැය පුරෝකථන ගැලපුම;
(ආ) අයකුම ක්‍රමවේදවල නියමයන් අනුව එළඹෙන හය මාස කාලසීමාව තුළ අදාල කර ගන්නා තොග සැපයුම ගණුදෙණු ගිණුමේ පෙන්වා ඇති පරිදි සත්‍ය තොග සැපයුම් අයකුම සහ පුරෝකථන අතර වෙනස සඳහා වන්දිය, තොග සැපයුම අයකුම පුරෝකථනවල ඇතුළත් වී තිබිය යුතු ය.

46. (1) කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද දිනය සහ මැයි මස අවසාන වැඩකරන දිනය අතර -

(අ) ඉදිරිපත් කිරීම අනුමතය සඳහා ලැබී පැය 24ක් ඇතුළත, කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය;

(ආ) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ඉල්ලීම් කළ යුතු අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ඇ) බලපත්‍රලාභියාට එම ඉල්ලීම ලද දින සිට වැඩකරන දින පහක් ඇතුළත, කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු සපයන ලෙස ඉල්ලීමක් කළ යුතු ය.

47. කොමිෂන් සභාව විසින් මැයි මස අවසාන වැඩ කරන දිනට පෙර, අයකුම කාලසීමාව සඳහා වන එළඹෙන මාස හයක කාලසීමාව සඳහා වන තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම සම්බන්ධ කෙටුම්පත් තීරණය අනුමත කළ යුතු අතර අනුමතයෙන් පැය 24 ක් ඇතුළත -

(අ) කෙටුම්පත් තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ආ) වැඩකරන දින දහයක් ඇතුළත කොමිෂන් සභාව විසින් අදහස්, නිරීක්ෂණය ආදිය භාර ගන්නා බව සියලු බලපත්‍රලාභීන්ට සහ මහජනතාවට දැනුම්දීම කළ යුතු ය.

48. ජුලි 15 දිනට පෙර ඔක්තොම්බර් 1 දිනෙන් ආරම්භ වන අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ කෙටුම්පත් තීරණය කොමිෂන් සභාව අනුමත කළ යුතු අතර, අනුමතයෙන් වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව විසින් -
(අ) අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය සඳහා අනුමතය සහ අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ සමුච්චිත අපගමනයන් සඳහා වන්දිය සියලු බලපත්‍රලාභීන්ට දැනුම් දීම කළ යුතු ය.
(ආ) අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය සහ අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ සම්මුච්ඡිත අපගමනයන් සඳහා වන්දිය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළයුතු ය.

**ග. අයකුම කාලසීමාවේ දෙවන හය මසක කාලසීමාව සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන්ගේ අයකුම උපලේඛනය සඳහා වන ගැලපුම්**

49. අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා අයකුම උපලේඛනයේ ගැලපුම් පිළියෙල කිරීම -

(අ) අදාල බලපත්‍රලාභියා විසින් සිදු කර මැයි මස පළමුවන වැඩකරන දිනට පෙර කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් සැප්තැම්බර් 15 වන දිනට පෙර සිදු කළ යුතු ය.

50. කොමිෂන් සභාව විසින් සැප්තැම්බර් 15 වන දිනට පෙර, එළඹෙන ඔක්තොම්බර් 1 වන දිනෙන් ආරම්භ වන එළඹෙන හය මසක කාලසීමාව සඳහා අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කළ යුතු ය.

51. කොමිෂන් සභාව විසින් එළඹෙන හය මසක කාලසීමාව සඳහා අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කිරීමෙන් පසු වැඩකරන දින දෙකක් ඇතුළත -

(අ) අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කළ බව සියලු බලපත්‍රලාභීන්ට දැනුම් දීම;

(ආ) අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය එහි වෙබ් අඩවියේ ඇතුළත් කිරීම; සහ

(ඇ) අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම,

කළ යුතු ය.

**ච. ගැලපුම් සහ පුරෝකථන කරන ලද තොග සැපයුම් අයකුම (ABST)**

52. ගැලපුම් සහ පුරෝකථන කරන ලද තොග සැපයුම් අයකුම (ABST) අයකුම ක්‍රමවේදය අනුව ඒකීය ජාතික අයකුමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ.

53. කොමිෂන් සභාව විසින් සැප්තැම්බර් 15 වන දිනට පෙර, එළඹෙන ඔක්තෝබර් පළමුවන දිනෙන් ආරම්භ වන හය මසක කාලසීමාව සඳහා එක් එක් අයට ඉන්වොයිස් කිරීමට තොග සැපයුම්කරු භාවිත කරන එක් එක් බෙදාහැරීම් බලපත්‍රලාභියා සඳහා වන ගැලපුම් සහ පුරෝකථනය කරන ලද තොග සැපයුම් අයකුම සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර -

(අ) අනුමතය සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ බෙදාහැරීම් බලපත්‍රලාභියාට දැනුම් දීම; සහ

(ආ) තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම,

කළ යුතු ය.

**ඔක්තෝම්බර් පළමු වන දිනයෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව තුළ දී අයකුම ගැලපුම්**

**ජ. සහනාධාර සඳහා ගැලපුම්**

54. කොමිෂන් සභාව විසින් ජූනි මාසයේ පළමුවන වැඩකරන දිනට පෙර, එළඹෙන වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය වන ප්‍රක්ශිප්ත සහනාධාර ප්‍රමාණය සහ එළඹෙන වර්ෂ සඳහා වන ප්‍රක්ශිප්ත ඇතුළත් කරමින් අයකුම සමාලෝචන කාලසීමාව තුළ භාර දෙන ලද සහනාධාර ප්‍රමාණ ප්‍රක්ශිප්ත වාර්තාවේ යාවත්කාලීන වන සහනාධාර ප්‍රමාණ ප්‍රක්ශිප්ත වාර්තාව පිළියෙළ කළ යුතු ය. මෙම වාර්තාව පහත සඳහන් කරුනු මත පදනම් විය යුතු ය:-

(අ) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් භාර දෙන ලද වර්ෂය සඳහා තොග සැපයුම අයකුම (මෙම ක්‍රමවේදයේ කලින් දැන නොසිටි);

(ආ) සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් සඳහා වන නැවත අයකර ගැනීමේ ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ආදායම;

(ඇ) අයකුම ක්‍රමවේදයේ දක්වා තිබෙන ආදායම් පාලන සූත්‍ර පදනම් කරගෙන බෙදාහැරීම් බලපත්‍රලාභීන් සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සඳහා වන ගැලපුම් කළ ආදායම;

(ඈ) මෙම මූලධර්ම අදාල කර ගනිමින් ප්‍රතිඵල ලෙස පුරෝකථනය කරන ලද අයකුම;

(ඉ) එළඹෙන වර්ෂය සඳහා ගැලපුම් කරන ලද වෙළඳපොළ පුරෝකථන (බලපත්‍රලාභියාගේ භාරදීම්වල ඉල්ලුම සහ පාරිභෝගිකයන් සංඛ්‍යාව පදනම් කරගෙන); සහ

(ඊ) වර්ෂය සඳහා අනුමත කරන ලද ඉඩහල අලාභය.

55. කොමිෂන් සභාව විසින් ඇස්තමේන්තු අයකුම කෙටුම්පත් තම වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

56. කොමිෂන් සභාව විසින් ජුනි මස පළමුවන වැඩකරන දිනට පෙර, සහනාධාර ප්‍රමාණ ප්‍රක්ෂිප්ත ගැලපුම් වාර්තාව භාණ්ඩාගාරය වෙත භාර දිය යුතු ය.

57. කොමිෂන් සභාව විසින් අයකුම කාලසීමාව සඳහා සහනාධාර ප්‍රමාණ අවශ්‍යතාවයන් පිළිබඳ මහා භාණ්ඩාගාරය දැනුම්දුන් විගස ජාතික අයවැය පිළියෙල කිරීමේ දී, සහනාධාරයන් ඇතුළත් කරන ලෙස ඉල්ලීමක් මහා භාණ්ඩාගාරය වෙත කළ යුතු ය.

58. ජූලි මස පළමුවන වැඩකරන දිනට පෙර සහනාධාර ප්‍රමාණ අනුමතය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලන ලද ඕනෑම අතිරේක තොරතුරු හෝ පැහැදිලි කිරීමක් කොමිෂන් සභාව විසින් අප්‍රමාදව සැපයිය යුතු ය.

**ට. සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර අනුමත ආදායම් ගැලපුම්**

59. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අයකුම සමාලෝචන සහ ගැලපුම් විස්තරාත්මක කාර්යපරිපාටිය අනුව, සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර ඉඩහල ආදායම් ගැලපුම් කොමිෂන් සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(අ) සම්ප්‍රේෂණ ඉඩහල ආදායම සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර අනුමත ආදායම් ගැලපුම් අයකුම කාලසීමාවේ පළමුවන, දෙවන, තෙවන සහ සිව්වන වර්ෂවල ජූලි මස අවසාන වැඩකරන දිනට පෙර භාර දිය යුතු ය.

(ආ) භාර දෙන ලද දිනය සහ අගෝස්තු මස පළමුවන වැඩකරන දිනය අතර කොමිෂන් සභාව විසින් -

(i) ඒ අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම කළ යුතු ය;

(ii) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(iii) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් එම ඉල්ලීම ලද දින සිට වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු සපයන ලෙස ඉල්ලීමක් කළ යුතු ය.

(ඇ) කොමිෂන් සභාව විසින් අගෝස්තු මස අවසාන වැඩකරන දිනට පෙර, කෙටුම්පත් ඉඩහල ආදායම අනුමත කළ යුතු අතර, එය අනුමත කිරීමෙන් පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාව විසින් -

(i) කෙටුම්පත් තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ii) වැඩ කරන දින 20 ක් ඇතුළත කෙටුම්පත් තීරණය සම්බන්ධව අදහස්, නිරීක්ෂණ ආදිය කොමිෂන් සභාව විසින් භාරගන්නා බවට සියලු බලපත්‍රලාභීන්ට සහ මහජනතාවට දැනුම් දිය යුතු ය.

(ඈ) කොමිෂන් සභාව විසින් ඔක්තෝම්බර් 15 වන දිනට පෙර, සම්ප්‍රේෂණ අනුමත ආදායම් සහ තොග සැපයුම සහ මෙහෙයුම් ව්‍යාපාර අනුමත ආදායම් සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර එම අනුමත කිරීමේ සිට වැඩකරන දින 5 ක් ඇතුළත -

(i) අනුමත කිරීම පිළිබඳව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට දැනුම්දීම; සහ

(ii) එම තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම,කළ යුතු ය.

**ඩ. බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම ගැලපුම්**

60. අයකුම සමාලෝචන සහ ගැලපීම් විස්තරාත්මක කාර්යපරිපාටින් අනුව, බෙදාහැරීම් බලපත්‍රලාභියා පහත කාරණා සඳහා අලාභ සාධක ගැලපුම ඇතුළත්ව බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම, කොමිෂන් සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය:-

(අ) අයකුම කාලසීමාවේ පළමුවන, දෙවන, තෙවන සහ සිව්වන වර්ෂවල ජූලි මස අවසාන වැඩකරන දිනට පෙර, අයකුම කුමවේදයේ ඇතුළත් වන ආදායම් පාලන සූත්‍ර අනුව බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම ගැලපුම කොමිෂන් සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය;

(ආ) භාර දෙන දිනය සහ අගොස්තු මස අවසාන වැඩකරන දිනය අතර කොමිෂන් සභාව විසින් -

(i) ඉදිරිපත් කිරීම අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම කළ යුතු ය; සහ

(ii) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

(ඈ) බලපත්‍රලාභියා විසින්, එම ඉල්ලීම ලද දින සිට වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු ලබා දිය යුතු ය.

(ඇ) කොමිෂන් සභාව විසින් අගෝස්තු මස අවසාන වැඩකරන දිනට පෙර, බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම ගැලපුම සම්බන්ධ කෙටුම්පත් තීරණය අනුමත කළ යුතු අතර එම අනුමතයෙන් පැය 24 ක් තුළ -

(i) කෙටුම්පත් තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම; සහ

(ii) වැඩ කරන දින විස්සක් ඇතුළත කොමිෂන් සභාව විසින් දල තීරණය සම්බන්ධව මත, නිරීක්ෂණ ආදිය භාරගන්නා බව සියළුම බලපත්‍රලාභීන්ට සහ මහජනතාව වෙත දැනුම් දීම, කළ යුතු ය.

(ඉ) කොමිෂන් සභාව විසින් ඔක්තෝම්බර් 15 වන දිනට පෙර, බෙදාහැරීම් ඉඩහල ආදායම සහ සිල්ලර සේවා අයකුම ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කිරීමෙන් පසු වැඩකරන දින 5 ක් ඇතුළත -

(i) අනුමත කිරීම පිළිබඳව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට දැනුම්දීම; සහ

(ii) එම තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම, කළ යුතු ය.

61. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අයකුම සමාලෝචන සහ ගැලපීම් විස්තරාත්මක කාර්යපරිපාටින් අනුව, තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධව පහත කරුණු අනුමතය පිණිස කොමිෂන් සභාවට භාර දිය යුතු ය:-

(අ) අයකුම කාලසීමාවේ පළමුවන, දෙවන, තෙවන හා සිව්වන වර්ෂ සඳහා අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් අයකුම කාලසීමාවේ අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ඔක්තෝම්බර් මස අවසාන වැඩකරන දිනට පෙර භාර දිය යුතු ය;

(ආ) සෑම භාරදීමක් ම -

(i) අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාවන් දෙකක් සඳහා උත්පාදන පිරිවැය පුරෝකථන ගැලපුම; සහ

(ii) අයකුම ක්‍රමවේදයේ නියමයන් අනුව එළඹෙන හය මසක කාලසීමාව සඳහා අදාළ කරගනු ලබන තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ පෙන්වා දී ඇති පරිදි සත්‍ය තොග සැපයුම සහ පුරෝකථන අතර වෙනස සඳහා වන්දිය, ඇතුළත් විය යුතු ය.

(ඇ) කොමිෂන් සභාව විසින්, භාර දෙන ලද දිනය සහ නොවැම්බර් මස අවසාන වැඩකරන දිනය අතර -

(i) භාර දීම අනුමතය සඳහා ලැබී පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය;සහ

(ii) කොමිෂන් සභාවට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක්, එකතු කිරීමක් ආදිය බලපත්‍රලාභියාගෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතු අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

(ඈ) බලපත්‍රලාභියා විසින් එම ඉල්ලීම ලද දින සිට වැඩකරන දින පහක් ඇතුළත කොමිෂන් සභාව වෙත ලිඛිතව පිළිතුරු සැපයිය යුතු ය.

(ඉ) කොමිෂන් සභාව විසින් නොවැම්බර් මස අවසාන වැඩකරන දිනට පෙර, අයකුම කාලසීමාවේ එළඹෙන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර අනුමතයෙන් පැය 24 ක් ඇතුළත -

(i) කෙටුම්පත්තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ

(ii) වැඩ කරන දින දහයක් ඇතුළත කොමිෂන් සභාව විසින් කෙටුම්පත් තීරණය සම්බන්ධව අදහස්, නිරීක්ෂණ ආදිය භාරගන්නා බව සියලුම බලපත්‍රලාභීන් සහ මහජනතාව දැනුවත් කළ යුතු ය.

(ඊ) කොමිෂන් සභාව විසින් ජනවාරි 15 වන දිනට පෙර, අයකුම කාලසීමාව තුළ අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය, අනුමත කළ යුතු අතර අනුමතයෙන් පසු වැඩකරන දින 5 ක් ඇතුළත -

(i) අයකුම කාලසීමාව තුළ ඒ හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කිරීම සහ අයකුම කාලසීමාව තුළ ඒ හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ සමුච්චිත විචලනයන් සඳහා වන්දිය සියළු බලපත්‍රලාභීන්ට දැනුම් දීම කළ යුතු ය; සහ

(ii) අයකුම කාලසීමාව තුළ හය මසක කාලසීමාවන් සඳහා තොග සැපයුම් අයකුම පුරෝකථන ගැලපුම් සම්බන්ධ තීරණය අනුමත කිරීම සහ අයකුම කාලසීමාව තුළ හය මසක කාලසීමාව සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ සමුච්චිත විචලනයන් සඳහා වන්දිය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම කළ යුතු ය.

**ත. අයකුම කාලසීමාවේ පළමු හය මසක කාලය සඳහා අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා අයකුම උපලේඛනයේ ගැලපුම්**

62. අවසාන විදුලි පාරිභෝගිකයන් සඳහා අයකුම උපලේඛනයේ ගැලපුම -

(අ) අදාළ බලපත්‍රලාභියා විසින් පිළියෙළ කර සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මස අවසාන වැඩකරන දිනට පෙර කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් සෑම වර්ෂයක ම මාර්තු 15 වන දිනට පෙර සැකසිය යුතු ය.

63. කොමිෂන් සභාව විසින් සෑම වර්ෂයකම මාර්තු මස 15 වන දිනට පෙර, අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා අයකුම ගැලපුම සම්බන්ධ තීරණය අනුමත කළ යුතු ය.

64. කොමිෂන් සභාව විසින්, මාස හයක කාලසීමාව සඳහා අයකුම ගැලපුම අනුමත කිරීමෙන් පසු වැඩ කරන දින දෙකක් ඇතුළත -

(අ) අයකුම ගැලපුම සඳහා අනුමතය බලපත්‍රලාභියාට දැනුම් දීම;

(ආ) අයකුම ගැලපුම සඳහා අනුමතය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම; සහ

(ඇ) අයකුම ගැලපුම සම්බන්ධ තීරණය ප්‍රසිද්ධියට පත් කිරීම,

කළ යුතු ය.

**ද. ගැලපුම් සහ පුරෝකථනය කරන ලද තොග සැපයුම් අයකුම (ABST)**

65. අයකුම ක්‍රමවේදය අනුව, ඒකීය ජාතික අයකුමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ගැලපුම් සහ පුරෝකථනය කරන ලද තොග සැපයුම් අයකුම(ABST) අවශ්‍ය වේ.

66. මාර්තු මස 15 වන දිනට පෙර, කොමිෂන් සභාව අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන පළමු මාස හයක කාලසීමාව සඳහා, තොග සැපයුම්කරු විසින් ඉන්වොයිස් කරන සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියකු සඳහා, ගැලපුම් සහ පුරෝකථන කරන ලද තොග සැපයුම් අයකුම සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර, අනුමතයෙන් පසු වැඩකරන දින පහක් ඇතුළත -

(අ) අනුමතය පිළිබඳ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට සහ බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට දැනුම් දීම කළ යුතු ය; සහ

(ආ) අනුමත කරන ලද තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම කළ යුතු ය.

**න. ඒකීය ජාතික අයකුමය (UNT) ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවිය යුතු පශ්චාත් සිද්ධි වන්දිය ගණනය කිරීම**

67. ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසයන් හි අවසාන වැඩකරන දිනට පෙර සෑම බලපත්‍රලාභියකු සහ සැපයුම් බලපත්‍රලාභියකු ම අයකුම ක්‍රමවේදයේ හඳුන්වා දී තිබෙන වන්දි සූත්‍රය අනුව බෙදාහැරීම් සහ සැපයුම් බලපත්‍රලාභීන්ට ගෙවිය යුතු වන්දියේ පශ්චාත් සිද්ධි වන්දි ගණනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු භාර දිය යුතු ය.

68. කොමිෂන් සභාව විසින් අප්‍රේල්, ජූලි, ඔක්තෝම්බර් සහ ජනවාරි යන මාසයන්හි පළමුවන දිනට පෙර, වන්දි සම්බන්ධ තීරණය අනුමත කළ යුතු අතර, එම අනුමතයෙන් පසු වැඩකරන දින පහක් ඇතුළත -

(i) ඒඅනුමතය පිළිබඳ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට සහ බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට දැනුම් දීම කළ යුතු ය; සහ

(ii) කොමිෂන් සභාවේ අනුමතය ලද වහාම එළඹෙන ඉන්වොයිස් කිරීමේදී වන්දි ප්‍රමාණය සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින්, සියලුම බෙදාහැරීම් සහ සැපයුම් බලපත්‍රලාභීන්ට හර/බැර කළ යුතු ය.

**ප. අතිවිශේෂ තත්ත්වයන් යටතේ සමාලෝචනය**

69. අයකුම ක්‍රමවේදය අනුව, අතිවිශේෂ සිද්ධියක් සිදු වූ අවස්ථාවේ දී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් අතිවිශේෂ ඉඩහල ආදායම සමාලෝචනය, කොමිෂන් සභාවේ අනුමතය සඳහා පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය:-

(අ) යම් වර්ෂයක් තුළ අනුමත ආදායම් සුචීකරන සූත්‍රයේ සම්මුචිත වෙනස 15% ඉක්මවන විට -

(i) ඒ වර්ෂයේ ජුනි 30 වන දිනට හෝ ඊට පෙර 15% ක් ඉක්මවා යන්නේ නම් හැකි ඉක්මණින් බලපැවැත්වෙන පරිදි ගැලපුම් සිදු කළ යුතු ය;

(ii) ජුනි 30 වන දිනට පසු 15% ඉක්මවා යන්නේ නම්, අයකුම කාලසීමාවේ එළඹෙන වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ගැලපුම් සිදු කළ යුතු ය;

(ආ) අනපේක්ෂිත සහ සැලකිය යුතු තොග සැපයුම් පුරෝකථන විචලනයක් සිදු වන්නේ නම්; සහ

(ඇ) යම් වර්ෂයක වූ අනපේක්ෂිත සිද්ධියක් හේතුවෙන් බලපත්‍රලාභියා විසින් දරන ලද පිරිවැය වර්ෂයේ අනුමත ආදායමෙන් 25% ඉක්මවන විට.

70. වර්ෂය තුළ ඕනෑම වේලාවක මෙම ඉදිරිපත් කිරීම සිදු කළ හැකි අතර, පහත සඳහන් උපලේඛනගත සමාලෝචන හෝ දින දර්ශන අනුව ගැලපුම් කිරීම් ක්‍රියාවලිය දක්වා මෙම සමාලෝචන කල් තැබීමට හෝ ඒවා අතිවිශේෂ ලෙස සැලකීමට කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු ය.

71. අතිවිශේෂ සමාලෝචනයක් කිරීම සුදුසු බව ඔප්පු කරන අනපේක්ෂිත සිද්ධියක් සඳහා කටයුතු කරන සියලු කරුණු සමඟ ඉල්ලීම සඳහා හේතුන්වල උපාංග මෙම ඉදිරිපත් කිරීමේ ඇතුළත් කිරීම කළ යුතු ය.

72. අනුමතය සඳහා ඉදිරිපත් කිරීම ලැබී පැය 24 ක් ඇතුළත එය කොමිෂන් සභාව විසින් තම වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

73. අනුමතය ලැබීමෙන් පසු වැඩකරන දින දහයක් ඇතුළත, කොමිෂන් සභාව විසින් අතිවිශේෂ සමාලෝචනය පිළිබඳ අවශ්‍ය කරනු ලැබිය හැකි යම් පැහැදිලි කිරීමක්, සංශෝධනයක් සහ එකතු කිරීමක් ආදිය සැපයීමට කොමිෂන් සභාව බලපත්‍රලාභියාට ලිඛිත ඉල්ලීමක් සිදු කළහැකි ය.

74. කොමිෂන් සභාවෙන් ඉල්ලීම ලැබූ දින සිට වැඩකරන දින පහක් ඇතුළත බලපත්‍රලාභියා විසින් කොමිෂන් සභාවේ ලිඛිත ඉල්ලීම්වලට පිළිතුරු සැපයිය යුතු ය.

75. කොමිෂන් සභාව විසින්, ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් පසු වැඩකරන දින විස්සක් ඇතුළත, පිළිගැනීම හෝ ප්‍රතික්ශේප කිරීම පිළිබඳ තීරණය කළ යුතු ය.

76. කොමිෂන් සභාව විසින් ඉල්ලීම ප්‍රතික්ශේප කරන අවස්ථාවේ, ප්‍රතික්ශේප කිරීම පිළිබඳ සාධාරණ හේතුන් ඉදිරිපත් කළ යුතු අතර, තීරණය ගැනීමෙන් පසු වැඩකරන දින එකක් ඇතුළත ප්‍රතික්ශේප කිරීම පිළිබඳ තීරණය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය.

77. කොමිෂන් සභාව විසින් ඉල්ලීම පිළිගන්නා අවස්ථාවක, එම තීරණය ගැනීම සම්බන්ධ සාධාරණ හේතුන් ඇතුලත්ව අතිවිශේෂ සමාලෝචනය පිළිබඳ කෙටුම්පත් තීරණය අනුමත කළ යුතු අතර අනුමතයෙන් පැය 24 ක් ඇතුළත කොමිෂන් සභාව විසින් -

(අ) කෙටුම්පත්තීරණය වෙබ් අඩවියේ ඇතුළත් කළ යුතු ය; සහ
(ආ) වැඩකරන දින විස්සක් ඇතුළත කොමිෂන් සභාව විසින් දල තීරණය පිළිබඳ අදහස්, නිරීක්ෂණ ආදිය භාර ගන්නා බව සියලු බලපත්‍රලාභීන්ට සහ මහජනතාවට දැනුම්දීම කළ යුතු ය.

78. කොමිෂන් සභාව විසින්, සාකච්ඡා කිරීමේ කාලය අවසන් වූ පසු වැඩකරන දින පහක් ඇතුළත, අතිවිශේෂ සමාලෝචනය පිළිබඳ තීරණය අනුමත කළ යුතු අතර -

(i) අනුමතය පිළිබඳ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට දැනුම් දීම කළයුතු ය; සහ
(ii) එය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම කළ යුතු ය.

08 - 453

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.